*සැ. යු.*- 2021.04.01 දින අංක 2222 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,223 - 2021 අප්‍රේල් මස 09 වැනි සිකුරාදා - 2021.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... ... | 794 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 807 |

*සැ. යු.*-(i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත 2021 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

791 B 82220 — 5,403 (2021/04)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල/දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත්ව සිටිය යුතුය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳපොල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

04-222

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල/දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

***සැ. යු.*** - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපළාත | උඩපළාත කොට්ඨාසයේ ගම්පොල කහටපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | දෙල්තොට | පාතහේවාහැට කොට්ඨාසයේ හේවාවිස්ස කෝරළයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩපළාත | උඩපළාත කොට්ඨාසයේ ඉල්ලවතුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | දොළුව | උඩපළාත කොට්ඨාසයේ ආඩියාකඩවත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩපළාත | උඩපළාත කොට්ඨාසයේ පුස්සැල්ලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර කොට්ඨාසයේ හන්දෙස්ස ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ දෙහිඅංග මුරුතලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | මැදදුම්බර | පාතදුම්බර හා මැදදුම්බර කොට්ඨාසයේ කුඹුක්කඳුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුදුම්බර | උඩුදුම්බර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

04-225

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු - නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය.

නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේදී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | අඹගමුව | හැටන් දික්ඔය නගරය කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

04-224

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය.

නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | තුම්පනේ | උඩපළාත බටහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා තුම්පනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| මහනුවර | හාරිස්පත්තුව | මැදසියපත්තුව අංක 01 කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හාරිස්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | උඩපළාත | කඳුකර ඉහළ බටහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උඩපළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | මිනිපේ | කන්දපහල උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උඩුදුම්බර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | දෙල්තොට | බෝපිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා පාතහේවාහැට කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | පස්බාගේ කෝරළය | පස්බාගේ කෝරළේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | පන්විල | පාතදුම්බර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | පස්බාගේ කෝරළය | පස්බාගේ කෝරළේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | තුම්පනේ | තුම්පනේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

04-223

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### සහකාර පුස්තකාලයාධිපති තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2021 අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

1. *වැටුප් පරිමාණය :*
2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,340-3 x 755/13 x 1,030- රු. 62,995 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 95,000.00 පමණ වේ)

2. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :*

2.1 (අ) අ.පො.ස.(සා/පෙළ) විභාගය සිංහල/දෙමළ, ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍යය සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම;

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනැමෙන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල/දෙමළ, ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍යය සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම;

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් ලබාගත් උපාධියක් සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව, ප්‍රලේඛන විද්‍යාව, හා විඥාපන විද්‍යා අවසන් වසර පරීක්ෂණයට අදළ සහතිකය හෝ කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා ප්‍රලේඛන සේවා පිළිබඳ වෘත්තීය උසස් සහතිකය ලබා තිබීම.

2.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පිළිගත් පුස්තකාලයක වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

2.3 පිළිගත් ආයතනයක් මගින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

3. *වයස් සීමාව :*
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

5. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මුලින්ම වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

7. රාජ්‍ය/පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි අයදුම්කරුවෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2021 අප්‍රේල් මස 09 වැනි දින.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

සහකාර පුස්තකාලයාධිපති තනතුර

---

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr/Mrs/Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික : [ ] කාර්යාලයීය : [ ]

04. (අ) උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :———. මාස :———. දින :———.

05. විවාහක/ අවිවාහක බව : (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/නැත)

08. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථයන් | සමත් වූ වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍යය | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| උපාධි නාමය | විෂයයන් | විශ්ව විද්‍යාලය | සමත් වූ වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
.............................................................................................................
.............................................................................................................

10. වෙනත් සුදුසුකම් :-..............................................................................................
.............................................................................................................
.............................................................................................................

11. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) මුල් පත්වීමේ දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.

.............................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?

එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

..........................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .................. තනතුර දරන .................................... මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

04-492/2

---

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආහාරපාන සහායක තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ''ආහාරපාන සහායක'' තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2021 අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ''ආහාරපාන සහායක'' යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

1. *වැටුප් පරිමාණය :*

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.28,250-9 x 300/10x 330/3 x 380-රු. 35,390 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 62,000.00 පමණ වේ).

2. *අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී සිටීම.

3. *වෘත්තීය සුදුසුකම් :*

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) /ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)/ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලා කාලය වසරකට නොඅඩු මූලික භෝජනාගාර සේවා පාඨමාලාවක්/ආහාරපාන සේවා පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

4. *පළපුරුද්ද :*

තරු පංතියේ හෝටලයක /පිළිගත් ආයතනයක භෝජනාගාර සේවක/ආහාරපාන සහායක තනතුරක වසර දෙකකට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

5. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 35 ට නො වැඩි විය යුතු ය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත/වෘත්තීය පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

7. *සේවා නියමයන් හා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(*ඇ*) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

9. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළිවෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2021 අප්‍රේල් මස 09 වැනි දින.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

*ආහාරපාන සහායක තනතුර*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (Mr/Mrs/Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය :————.

දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (I) උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)

(II) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු :———. මාස :———. දින :———.

05. විවාහක/ අවිවාහක බව : (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය : (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථයන් | සමත් වූ වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතු ය) :
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

10. වෙනත් සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතු ය.) :
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

11. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) දැනට දරන තනතුර :————.
(ඇ) මුල් පත්වීමේ දිනය :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.
..........................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.
..........................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04-492/1

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019(2021)

අංක 1930/12 හා 2015.09.01 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට සීමිත පදනම යටතේ උසස් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ජූලි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලය ඇත.

02. 2019.12.31 දිනට,

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (5) ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක පහ (5) ම උපයාගෙන ඇති;

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති;

(iii) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී ඇති නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

03. විශේෂ ශ්‍රේණියේ නිලධරයන් සඳහා පහත වැටුප් ක්‍රමය බලපැවැත්වේ. :-
(MN-7-2016- 4 පියවර) රු. 43,845-8 x 755 - 18 x 1030 - රු. 68,425

04. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ. :-

(i) මෙම විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

(ii) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

(iii) බඳවා ගන්නා ප්‍රතිශතයන් ඃ

| | |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60% |

(iv) අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.

(v) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව 04කට වැඩි නම්, ඉහත ඡේද අංක 04. iii හි සඳහන් ප්‍රතිශතයන්ට යටත්ව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුය.

(vi) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාගය පැවැත්වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(vii) පුරප්පාඩු පිරවීමේදී අයදුම්කරුවන් අතුරින් මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් ලකුණු අනුපිළිවෙල අනුව අදළ උසස් කිරීම් සඳහා සළකා බලනු ලැබේ.

05. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත අනුව අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින්ද, 2021.05.10 වන දින හෝ ඊට පෙර, විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත තම අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *අනන්‍යතාව සනාථ කිරීම* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(*අ*) ජාතික හැඳුනුම්පත්‍රය;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(*ඇ*) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

07. *අයදුම්පත්* :

(i) ''A4'' ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා මාධ්‍ය අයදුම්පත්වල හා දෙමළ භාෂා මාධ්‍ය අයදුම්පත්වල අදාළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න අයදුම්කරු විසින් ම විමසා බැලීමට කටයුතු කළ යුතුය. එම අයදුම්පතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරුවන්ට තම අයදුම්පතේ සඳහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර, අයදුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුවේ.

(iv) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 600 ක විභාග ගාස්තුවක් 20-03-02-13 විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට ඕනෑම තැපැල්/උප තැපැල්, ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපතේ මුල් පිටපත අයදුම්පතේ අදළ කොටුවේ ඇලවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව ආපසු ගෙවීම හෝ වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

08. (i) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයත්වන රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේම අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදයි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ

කුවිතාන්සිය සුදනමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්පතේ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දිනයේදී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. ඉහත (08) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

10. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :
මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

11. විභාග පරිපාටිය :

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඔබ අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.
(1) අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 1 කි. - ලකුණු 100 යි
(2) කළමනාකරණය - කාලය පැය 3 කි. - ලකුණු 100 යි.

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුවේ.

පළමුවන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ. :-

**අභියෝග්‍යතා පරීක්ෂණය - විෂය අංකය (1)**

තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ. :-

**කළමනාකරණය - විෂය අංකය (2)**

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිත
සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය
(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත. මෙම නිවේදනයට අදළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2021 මාර්තු මස 25 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2021)
Limited Competitive Examination for Promotion of the Officers in Grade I of Sri Lanka Technological Service to Special Grade - 2019 (2021)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) ඔබ සේවයට බඳවා ගෙන ඇත්තේ මධ්‍යම රජය යටතේද? නැතහොත් කුමන පළාත් රාජ්‍ය සේවය යටතේද? අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න.

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| මධ්‍යම රජය | 10 |
| බස්නාහිර පළාත් | 01 |
| මධ්‍යම පළාත් | 02 |
| දකුණු පළාත් | 03 |
| උතුරු පළාත් | 04 |

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| නැගෙනහිර පළාත් | 05 |
| වයඹ පළාත් | 06 |
| උතුරු මැද පළාත් | 07 |
| ඌව පළාත් | 08 |
| සබරගමුව පළාත් | 09 |

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ඇ) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(ඈ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ඉ) රාජකාරි ලිපිනය : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)
————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
————.
(සිංහලෙන්/දෙමළෙන්)

(ඊ) ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(පුරුෂ - 0/ස්ත්‍රී - 1)

(උ) ජාතික හැඳුනුම්පත් අංකය :

(ඌ) ජංගම දුරකතන අංකය :

02. ඔබ අයත් වන දෙපාර්තමේන්තුව :————.

03. පදවි නාමය :————.

04. 2021.05.10 වැනි දිනට සේවා කාලය ඃ

අවුරුදු ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

05. (i) උපන් දිනය ඃ

අවුරුද්ද ඃ ☐☐☐☐ මාසය ඃ ☐☐ දිනය ඃ ☐☐

(ii) 2021.05.10 දිනට වයස ඃ

අවුරුදු ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

| |
|---|
| විභාගයට පෙනී සිටින්නේ පළමු වන වතාවට නොවේනම් රු. 600 ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සි අංකය :————.
ගෙවූ කාර්යාලය :————.
ගෙවූ මුදල :————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***සටහන*** ඃ තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු හෝ තමාගේ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානියාගේ හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

***අත්සන සහතික කිරීම***

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................ මහතා/මහත්මිය/මෙනෙවිය ............ දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන
නිල මුද්‍රාව.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය**

(i) මෙම අයදුම්කරුට එරෙහිව පැවැත්වෙන හෝ පැවති විනය පරීක්ෂණ පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ

..............................................................
..............................................................
..............................................................

(ii) ඉහත අංක 01 සිට 05 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත්, මෙම අයදුම්කරුට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තු ගෙවා කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
නිල මුද්‍රාව

දිනය :————.

*සටහන* : සහතික කළ එක් පිටපතක් නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට යැවිය යුතු අතර, අනෙක් පිටපත අප්‍රමාදව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

04-340

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ "වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021 මැයි මස 15 වැනි දින වේ.

*සටහන* : ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින් ම විඳදරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් එක් අයෙකු, **වැඩ පරීක්ෂක III වන ශ්‍රේණියේ** තනතුර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.
II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර (03) ක පරිවාස කාලයකට යටත් වන අතර එම වසර (03) ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.
III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව වසර 05ක් තුළදී 11 බණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතු ය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 3- 2016 යටතේ රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - රු. 57,550ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

4. i. *අධ්‍යාපන සුදුසුකම් :*

1. භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව විෂයන් සඳහා සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

*හා*

2. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

4. ii. *වෘත්තීය සුදුසුකම්*

1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

6. *කායික සුදුසුකම් :*
සෑම අයදුම්කරුවෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *ලිඛිත විභාගය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 | 100 | 40% | ගොඩනැගිලි ඉදිකිරීම, සැලසුම් සකස් කිරීම, නඩත්තු (වායු සමීකරණ, ජලනල, විදුලිය) පිඹුරුපත් කියවීම, වැඩ බිමක සේවක කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප |
| 2. බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% | සාමාන්‍ය දැනීම |

8. i. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :** ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

9. *විභාග කොන්දේසි :*

i. විධිමත් ලෙස අයදුම්පත් ඒවා ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු/ අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

ii. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

iii. තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කල යුතු ය. මේ සඳහා,

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

iv. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

v. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ආහාර කොමසාරිස් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ;

vi. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ;

vii. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීමේ අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ.

10. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

i. ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 (සෙ.මී. 24x29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්, අංක 01 සිට 04 තෙක් ඡේද පළමු පිටුවට ද, අංක 05 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලටද ඇතුළත්වන සේ සකස් කර තම අත් අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු ය;

ii. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, සඳහන් කළ යුතු ය;

iii. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ;

iv. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය;

v. විභාග ගාස්තුව රු. 750.00 කි. එම විභාග ගාස්තුව, ආහාර කොමසාරිස් නමින් ලංකා බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ ගිණුම් අංක 7042667 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ රිසිට්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ;

vi. සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය;

vii. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය;

viii. අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය ලබාදීම ආහාර කොමසාරිස් සතුවේ. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ජේ. ක්‍රිෂ්ණමූර්ති,
ආහාර කොමසාරිස්,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.

2021 ක් වූ මාර්තු මස 24 වැනි දින,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.
අංක 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021*

*Open Competitive Examination for the Recruitment of Supervisory Management Assistant (Technical Service Category) Inspector of Works Grade III of Food Commissioner's Department - 2021*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ：

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA HERATH)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 දුරකතන අංකය :————.

4.0 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 5.1 උපන් දිනය : වර්ෂය ： මාසය ： දිනය ：

5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු ： මාස ： දින ：

6.0 අධ්‍යාපන සුදුසුකම් ：

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර ：

I. විභාගයේ වර්ෂය හා මාසය :————.

II. විභාග අංකය :————.

III. ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

6.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

I. විභාගයේ වර්ෂය හා මාසය :————.

II. විභාග අංකය :————.

III. ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 3 | |
| 2 | | 4 | |

6.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම් :

I. විශ්ව විද්‍යාලය :————.

II. උපාධිය :————.

III. විභාග අංකය :————.

7.0 *වෘත්තීය සුදුසුකම්* :

I. ————————————————.

II. ————————————————.

8.0 පළපුරුද්ද :————.

9.0 ඔබ කවදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) :————.

10.0 විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ විස්තර:

I. විභාග ගාස්තුව ගෙවන ලද ලංකා බැංකු ශාඛාව :————.

II. ගෙවූ මුදල රු. :————.

| විභාග ගාස්තු ගෙවූ රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(රිසිට්පතේ ඡායා පිටපත් ළඟ තබා ගන්න) |
|---|

11.0 *අයදුම්කරුගේ සහතිකය* ඃ

(*අ*) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.
(*ඇ*) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................... මහතා/මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම රිසිට්පත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13.0 *රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම්කරු වන .................................... මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ ආයතනයේ ස්ථිර/ අනියම්/ තාවකාලික නිලධාරියකු/ නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිලමුද්‍රාව තබා සහතික කළ යුතු ය.)

04-276

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)

1. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ජූලි මස දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථාන ස්ථාපනය කරනු ලබන නගර හා ඊට අදාළ නගර අංක පහතින් දැක්වේ. :-

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| බදුල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |

ඉහත සඳහන් යම්කිසි ස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුනහොත් එම මධ්‍යස්ථානය අවලංගු කරන අතර එම අයදුම්කරුවන් යාබද මධ්‍යස්ථානයක් වෙත යොමු කෙරෙනු ඇත. ඉල්ලුම් කරන

නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

3. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

4. සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු ප්‍රමාණය, අධි ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා කුසලතා ධාරාව හෝ සීමිත ධාරාව යටතේ පැවැත්වෙන තරග විභාග අතරින් පළමුව පවත්වන තරග විභාගයේ අවසන් දිනට ගණනය කරනු ලැබේ. එම පුරප්පාඩු ප්‍රමාණය අදාළ විභාගයේ අවසන් දිනට පසු නැවත ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන අතර එසේ ප්‍රසිද්ධ කළ පසු පුරප්පාඩු ප්‍රමාණය නැවත සංශෝධනය නොකරනු ඇත. එම දිනයට අදාළ පුරප්පාඩුවලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත් කිරීම් කරනු ලබන්නේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත වේ. සීමිත තරග විභාගය සමත්වීම සඳහා විභාගයට අදාළ එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අධිශ්‍රේණියට පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහි දී ලකුණු ලබාදීමක් සිදු නොවේ.

5. 2016.02.25 දිනැති හා අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 7-2016 වැටුප් බණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 41,580/- 11 x 755 - 10 x 1080- රු. 68,425 ක් වේ.

*සපුරාලිය යුතු සුදුසුකම් :*

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති ඒකාබද්ධ සේවයට අයත්,

(*අ*) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම;

හෝ

(*ආ*) අවම වශයෙන් සේවයේ වසර අට (08) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරියකු වීම.

හෝ

(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම;

සහ

(*ඈ*) නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම.

(i) **සටහන**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ දැනට රැඳී සිටින ශ්‍රේණිය අනුව ඉහත (අ), (ආ), (ඇ), මගින් දක්වා ඇති සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරන ලද දැනට රැඳී සිටින ශ්‍රේණියට අදාළව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සම්පූර්ණ කළ යුතු වන අවම වාර ගණන තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සමත් වූ නමුත් පරිපාලන හේතූන් මත අදාළ කාර්යක්ෂමතා කඩඉම් සහනය ප්‍රමාදවීම නිසා සේවයේ ස්ථිරවීම හෝ උසස්වීම හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අහිමිවීම නිසා පමණක් සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද, මෙම විභාගයට අයදුම් කළ හැකි වේ.

(ii) **සටහන**

කෙසේ වෙතත් එම නිලධාරීන්ට අයදුම් කිරීමට සහ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම උසස්වීම ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවන අතර අධිශ්‍රේණියට උසස්වීම් ලිපිය නිකුත් කරනු ලබන්නේ නිසි පරිදි කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සතුටුදායක සේවා කාලය සපුරන ලද බවට සෑහීමට පත්ව අදාළ ස්ථිර කිරීම/උසස් කිරීම උපයාගත් පසුව වේ.

7. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) අයදුම්පත මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ. මී. 25.5 x 21 (A 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත් අකුරින්ම පිරවිය යුතුය. අංක 01 සිට 05 දක්වා පළමුවන පිටුවට ද, 06 සිට 09 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන සේ ගෙන සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට/දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත සකස් කර ගත යුත්තේ අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම ය.

(සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

(*ආ*) *ආයතන ප්‍රධානියාගේ සහතික කිරීම* :
අපේක්ෂකයින් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත, ඡායා පිටපතක් ද සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු ඡායා පිටපත පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කර මුල් පිටපත තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින්

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තැ.පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට 2021.05.10 වන දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවනු ලබන අයදුම්පතට අමතරව වෙනත් කිසිඳු අයදුම්පත් පිටපතක් පෞද්ගලිකව එවීම නොකළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑම අයදුම්පතක්ම සෑම අයුරකින්ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර ආදර්ශ අයදුම්පතේ අංක 14න් දක්වෙන ආයතන ප්‍රධානියාගේ සහතිකය ද අත්සන් කළ යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියකුගේ හෝ පෞද්ගලික ලිපිනයකට නොඑවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)**'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(*ඇ*) (i) පළමුවන වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමු වතාවට පෙනී සිටින අයැදුම්කරුවන් ලෙස සලකන්නේ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999, හෝ 2001 වර්ෂවල පවත්වන ලද සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1985 හා 1996 වර්ෂවල පවත්වන ලද රජයේ යතුරු ලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1996 වර්ෂයේදී පවත්වන ලද රජයේ ලඝුලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1999 වර්ෂයේදී පවත්වන ලද රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ හෝ රජයේ ගබඩා භාරකාර සේවයේ අධිපන්තියේ සීමිත තරග විභාග යකට හා 2006, 2007, 2011, 2015 සහ 2018 වර්ෂවල දී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගයන් යන විභාග අතුරෙන් එකදු විභාගයකට හෝ පෙනී නොසිටි අයදුම්කරුවන් පමණකි.

(ii) විභාග ගාස්තුව රු. 600 කි. තව ද එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් /උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. එසේ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

(*ඈ*) අයදුම්පතක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) අයදුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

08. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(*අ*) අදළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත විභාග දිනයේ දී ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුග මනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(*ඇ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග

දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි පිටපත ද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදළ ලදුපතෙහි පිටපත ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක පදිංචිකරුවකු නම්, ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපත්ක ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත.

**සටහන.**-අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

(අ) මෙම විභාගයට අදළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු/ඇය තවදුරටත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

11. *විභාග මාධ්‍යය*-මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් විසින් තමන් සේවයට ඇතුළත්වීම සඳහා තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂා මාධ්‍යයකින් හෝ පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. *විභාග පරිපාටිය*:-ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|
| (1) කාර්යාල කළමනාකරණය | පැය 2 | 100 |
| (2) කාර්යාල ක්‍රම | පැය 2 | 100 |
| (3) ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 |
| (4) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 2 | 100 |
| (5) පොදු ප්‍රශ්න පත්‍රය | පැය 1 1/2 | 100 |

13. *විෂයය නිර්දේශය* :
අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් විෂයයන් පිළිබඳව දැනුමක් අපේක්ෂා කරනු ලැබේ.

(i) කාර්යාල කළමනාකරණය (කාලය පැය 02යි ලකුණු 100)
සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්මය, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාවය, සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය.

(ii) කාර්යාල ක්‍රම (කාලය පැය 02යි ලකුණු 100)
කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැලසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැළැස්ම් හා වටපිටාව, රැකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත

(iii) ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති (කාලය පැය 02යි ලකුණු 100)
රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින්

මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

(iv) රාජ්‍ය මූල්‍ය කළමණාකරණය (කාලය පැය 02යි ලකුණු 100)

වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම් ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය,අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදයම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

(v) **පොදු ප්‍රශ්න පත්‍රය ( කාලය පැය 1 1/2යි ලකුණු 100)** රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාරධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු, නිල තත්ත්වය හා සිවිල් තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

14. *පත්කිරීම සඳහා තෝරා ගැනීම* :

(i) ඉහත විභාගය සමත් වී සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් විෂයය සඳහා යටත් පිරිසෙන් ලකුණු 40 බැගින්වත් ලබා ගත යුතු වේ. විභාගයේදී ලබා ගන්නා මුළු ලකුණුවල එකතුව අනුව සැකසෙන කුසලතා අනුපිළිවෙළ අනුව අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හමුවට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි කාර්යාලයක සේවය කිරීමට සූදානම් විය යුතුය. අනුයුක්ත කෙරෙන කාර්යාලයේ පත්වීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ ඇයගේ පත්වීම අවලංගු කර ඊළගට සුදුසුකම් ලබන අයවලුන් පිළිවෙළින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

(ii) පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතුන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(iii) ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂමේ දැනුම් දීමට අනුව ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. සෙසු අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල www.reults . exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම හෝ පෞද්ගලිකව දන්වා යැවීම සිදු කෙරෙනු ඇත.

15. රාජ්‍ය සේවයේ පත්වීම පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 1840/34 හා 2013 දෙසැම්බර් මස 11 වැනි දින රජයේ අතිවිශේෂ *ගැසට්පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා සංග්‍රහයේ පනවා ඇත. නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවේ දැනටමත් කර ඇති හෝ මතුවටත් කරනු ලබන සංශෝධනවලට ද මෙම විභාගය පැවැත්වීම හා අධිශ්‍රේණිවලට උසස් කිරීම සිදු කරනු ලැබේ.

16. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමටද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

17. මෙම ගැසට් නිවේදනයේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා පළාත් සභා,
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2021 මාර්තු මස 26 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

–

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)
LIMITED COMPETITIVE EXAMINATION FOR APPOINTMENT TO SUPRA GRADE OF MANAGEMENT SERVICE OFFICERS SERVICE - 2019(2020)

විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :
සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය

| නගරයේ නම | නගර අංකය |
|---|---|
| | |

ඔබ අයත්වන සේවය :

**සැලකිය යුතුයි.**- පළාත් රාජ්‍ය සේවා වල නිලධාරීන්ට මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට අවසර නොමැත. විභාග කොමසාරිස් ජනරාල් දන්වා ඇති පරිදි රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයේ හඳුනා ගැනීම් කේතය ''10'' වන බැවින් ඉහතින් දක්වා ඇති ''ඔබ අයත් වන සේවය'' යන්න ඉදිරියේ ඇති කොටුවේ අංක 10 යොදන්න. මීට සමගාමීව පළාත් රාජ්‍ය සේවාවන්ගේ නිලධාරීන්ගෙන් ද ඒ ඒ පළාත් රාජ්‍ය සේවාවන්ගේ අධිශ්‍රේණියේ තනතුරුවලට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවන්නේනම් එම අයදුම්පත්වල සඳහන් කළ යුතු කේත අංක සම්බන්ධයෙන් ඒ ඒ පළාත් සභාව මගින් අදාළ විභාග නිවේදනය පළකිරීමේ දී උපදෙස් ලබා දෙනු ඇත.

01. 1.1 මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) උදා : ඒ. බී. සී. ඩී. සිල්වා
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

02. 2.1 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ)
2.2 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.4 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. උපන් දිනය :

වර්ෂය මාසය දිනය

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

05. ජංගම දුරකථන අංකය :

06. විවාහක/අවිවාහක බව : (අදාළ කොටුව තුළ ලියන්න)

අවිවාහකයි - 01 ☐
විවාහකයි - 02

07. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. මෙම විභාගය 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හා 2001 යන වර්ෂවල පවත්වන ලද සාමාන්‍ය ලිපිකාර සේවයේ /1985, 1996 රජයේ අතුරු යතුරු ලේඛක සේවයේ/1996 රජයේ ලඝු ලේඛක සේවයේ/1999 රජයේ පොත් තබන්නා සේවයේ/1999 රජයේ සරප් සේවයේ හෝ 2006, 2007, 2011, 2015 සහ 2018 වර්ෂවල දී පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගවලින් කවරකට හෝ ඔබ පෙනී සිටියේ ද? :————.

09. (i) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට/සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත් තබන්නා සේවයට/රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට පත් වූ දිනය :————.

(ii) අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට එහි මුළු සේවා කාලය :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

(iii) අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට ලබා ඇති වැටුප් රහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) දින ගණන :————.

(iv) ඒ අනුව අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට සක්‍රීය සේවා කාලය :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

(v) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/සාමාන්‍ය ලිපිකාර සේවයේ/රජයේ යතුරු ලේඛක සේවයේ/රජයේ ලඝුලේඛක සේවයේ/රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ/රජයේ ගබඩා භාරකාර සේවයේ පත්වීම ස්ථිර කරන ලද දිනය :————.

(vi) දැනට සිටින ශ්‍රේණිය හා ඊට ඇතුළත් වූ දිනය :————.

(vii) ඔබ උපාධිධාරියෙකු නම් උපාධිය ලැබූ වර්ෂය, විශ්වවිද්‍යාලයේ නම :————.

(viii) උපාධිය වලංගු වන දිනය :————.

10. (i) ඔබ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට/සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත් තබන්නා සේවයට/රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට ඇතුළත්වීමේ තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

(ii) තරගවිභාගයක් රහිතව ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයට/රජයේ යතුරු ලේඛක සේවයට/රජයේ ලඝුලේඛක සේවයට/රජයේ පොත් තබන්නා සේවයට/රජයේ සරප් සේවයට/රජයේ ගබඩා භාරකාර සේවයට බඳවා ගන්නා ලද්දේ නම් එම සේවයට ඇතුළත් වීම සඳහා ඔබ සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යය :————.

11. ඔබගේ පෞද්ගලික ලිපි ගොනුව පවත්වාගෙන යන කාර්යාලය සහ ආයතන ප්‍රධානියා ද, ඇතුළුව ලිපිනය පැහැදිලිව සඳහන් කරන්න.........................................................................................................
.........................................................................................................

12. මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න.

| |
|---|
| විභාග ගාස්තු ගෙවන ලද මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (ලදුපත) නොගැලවෙන සේ මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |

13. අයදුම්කරුගේ ප්‍රකාශය ෛ

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ ලැබිය යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් (සේවා හා දෙපාර්තමේන්තුමය පරීක්ෂණ පැවැත්වීම කොන්දේසියක් වන වේතනාධික හැර) එම කාලය තුළ කවර ආකාරයක හෝ කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නැති බවත් ප්‍රකාශ කරමි.

මෙම විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ............... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා ......... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බවත්* ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. *ආයතන ප්‍රධානියාගේ සහතිකය* ෛ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................. මයා/මිය/මෙනවිය* ............... වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ............... දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයෙහි ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත්* ඔහු/ඇය* විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබීමට සුදුසු බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, අදාල *ගැසට්* නිවේදනයෙහි ප්‍රකාර විභාගයට පෙනී සිටීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සපුරා ඇති බවත්, විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 13 හා 1972.10.02 වැනි දින දරන චක්‍රලේඛ ලිපියෙහි පරිදි ඒ බවට සටහනක් නිලධාරියාගේ චර්යා සටහන් පත්‍රයෙහි තබන්නට යෙදුණු බවත්, ............ දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. ඔහු/ඇය*..................... කළමනාකරණ සේවා නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ලිපියේ/පත්වීම් ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකය ............ හා දිනය ............ වේ.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

(*අනවශ්‍ය වචන කපාහරින්න)

04-355

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### විදේශ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021)

ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ (මෙහි මින් ඉදිරියට 'සේවය' යනුවෙන් සඳහන් වන) පවතින පුරප්පාඩු 40ක් පිරවීම සඳහා පහත අංක 02හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ජූලි මස කොළඹ දී පවත්වනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණුවල එකතුව මත කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

I. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්;

හෝ

- උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්;

හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශ විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම. (මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුවේ.)

II. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකුම මෙරට හෝ ලෝකයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

III. වෙනත්:

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. (ද්විත්ව පුරවැසිභාවය ඇති අය ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වුවහොත් ඔවුන් සිය විදේශ පුරවැසිභාවය අවලංගු කරවා ගතයුතු අතර සිය සේවා කාලය තුළ වෙනත් රටක පුරවැසිභාවය ලබා නොගත යුතුය.)

(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

සටහන :

i. කුමන හෝ ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට ශ්‍රී ලංකා විදේශ සේවයට තෝරා ගැනීමේ විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නැත.

ii. එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් අවස්ථා තුනක් පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටිය හැකිය.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනයට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

I. මෙම සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත, වසර 2016.12.06 දින ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක්කර ඇත්තා වූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වෙතොත් ඒවාද සමඟ එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත් විය යුතුය.

II. මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

III. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/ භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතුය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද රජයේ මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත්වේ.

VI. කිසියම් අපේක්ෂකයකු සේවයට බඳවා ගැනීමෙන් පසුව වුවද මෙම නිවේදනයේ හෝ ශ්‍රී ලංකා විදේශ සේවයේ ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් සුදුසුකමක් හෝ කොන්දේසියක් සපුරා නොමැති බවට හෝ සාවද්‍ය තොරතුරු සපයා ඇති බව තහවුරු වුවහොත් ඔහුගේ හෝ ඇයගේ සේවය අහෝසි කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

04. *වයස් සීමාව :*

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට එළඹ සිටිය යුතු අතර අවුරුදු 30ට නොඑළඹ සිටිය යුතුය. (ඒ අනුව 1999.05.10 දිනට හෝ ඊට පෙර හා 1991.05.10 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු නම්, ඔහු/ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 37ට නොඑළඹ සිටිය යුතු අතර, (ඒ අනුව 1984.05.10 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක්) සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතුය.

සටහන :

i. ඉහත 04 ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ 1 වෙනි පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

ii. අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළ දී හෝ සේවයේ යෙදී සිටි කාලසීමාව ඊට අඩු නම් එම මුළු කාලසීමාවේ දී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

iii. රාජ්‍ය සේවයේ නිලධාරියකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු/ඇය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාලසීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු සේවා කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාලසීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

iv. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගිනි.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළව 2016.02.25 දිනැති අංකඃ 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 47,615-10X1,335-8X1,630-17X2,170 -රු.110,895 (SL-1-2016) - මාසිකව

06. *ලිඛිත විභාගය :*

I. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ජූලි මස කොළඹදී පවත්වනු ලැබේ.

II. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත් වේ.

III. අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභාගයට පෙනී සිටිය හැක. එසේ වුවද ඔහු/ ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියලුම විෂයන්ට පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

IV. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් සමන්විත වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි මෙහි I කොටස විභාග කොමසාරිස් ජනරාල් විසින් සමාන්තර සේවා සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයක් යටතේ පැවැත්වීමට ඉඩ ඇති අතර එවැනි අවස්ථාවකදී මෙම නිවේදනය අනුව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්පත් ශ්‍රී ලංකා විදේශ සේවයේ තනතුරු පුරප්පාඩුවලට අදාළව එම පොදු තරග විභාගය සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත් සේ සලකා කටයුතු කෙරෙනු ඇත.

I කොටස

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 1/2 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ/ හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. | 40 |
| අවබෝධය | පැය 02 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ/ හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. | 40 |

II කොටස

| *විෂය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01. | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |
| 02. | ලෝක තතු I | පැය 03 | 100 | 40 |
| 03. | ලෝක තතු II | පැය 03 | 100 | 40 |
| 04. | සාරාංශය | පැය 01 | 100 | 40 |
| 05. | භාෂා ප්‍රවීණතාව | පැය 03 | 100 | 40 |

සටහන :

i. සියලුම අයදුම්කරුවන් ලිඛිත විභාගයේ I කොටසට පෙනී සිටිය යුතු වේ.

ii. ලිඛිත විභාගයේ I කොටසේ එක් එක් විෂයට අවම වශයෙන් ලකුණු 40 බැගින් හා විෂයන් දෙකෙහිම මුළු ලකුණු එකතුව අවම වශයෙන් 100ක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයේ II කොටසට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

V. ලිඛිත පරීක්ෂණය පවත්වන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

VI. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

VII. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටියකට අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

VIII. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබාදෙනු නොලැබේ.
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු : ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම

IX .ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

### I කොටස

(අ) බුද්ධි පරීක්ෂණය:
අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය,සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලුවිසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

(ආ) අවබෝධය:
අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

### II කොටස

(අ) පොදු ප්‍රශ්න පත්‍රය:
ශ්‍රී ලංකාවේ දේශපාලන, ඉතිහාසය, සාමාජයීය,සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳවත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන වත්මන් කරුණු පිළිබඳව සහ තාක්ෂණික හා විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳවත් අයදුම්කරු ලබා ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(ආ)ලෝක තතු I :
සමස්ත ලෝකයේ සාමය, ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා සහ ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා, ලෝකයේ දේශපාලන සිදුවීම්, එක්සත් ජාතීන්ගේ සංවිධාන හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා ගැටුම් තත්වයන් හා නොයෙකුත් ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරවල දියුණුව අළලා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

(ඇ) ලෝක තතු II :
ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය, කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම, පරිසරය හා ධරණීය සංවර්ධනය වැනි ප්‍රශ්න ද ඇතුළත්ව වෙළෙඳාම හා ආර්ථික සංවර්ධනය පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා හා ඒවා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු වේ.

(ඈ) සාරාංශය :
දී ඇති ඡේදයක/ඡේදයන්හි අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇදගන්නා ආකාරයෙන් පැහැදිලිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(ඉ) භාෂා ප්‍රවීණතා ප්‍රශ්න පත්‍රය:
භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ලෙස ප්‍රශ්න පත්‍ර 03ක් වන අතර මුළු ලකුණු ප්‍රමාණය 100ක් වේ. කාලය පැය 03කි.)සිංහල මාධ්‍යයෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයින් ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයකට ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයින් සිංහල හෝ දෙමළ භාෂා ප්‍රශ්න පත්‍රයකට ද පෙනී සිටිය යුතු ය.

07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

I. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට එක් එක් විෂයය සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් සහ ලේකම්වරයා විසින් නියම කරනු ලබන, 350කට නොඅඩු මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා වූ අයදුම්කරුවන් පමණි. එතකුදු වුවත්, එසේ කැඳවනු ලබන සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි විය යුතුය.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100ක් හිමි වේ.

III. කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක්

විසින් අපේක්ෂක අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/ අපේක්ෂිකාව බඳවා ගනු ලබන සේවයට ඔහුගේ/ ඇයගේ යෝග්‍යතාව මැන බැලීම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තම නිගමනයට එළඹීමේදී අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ බුද්ධිය සහ මානසික උත්සුකතාව කෙරෙහිත්, පෞරුෂත්වය කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අනෙකුත් භාෂා ප්‍රවීණතාවන්, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පරිගණක හැකියාව මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඇගයීමට ලක් කරනු ඇත.

V. ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට දැනගැනීමට සලස්වනු නොලැබේ.

VI. ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු ප්‍රමාණයට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණය එකතුකර කුසලතා අනුපිළිවෙළ සකස් කරනු ලැබේ. කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරකට බඳවාගනු ලැබේ.

VII. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ආකාරය පහත පරිදි වේ.

| යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ නිර්ණායක | | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපනික සුදුසුකම් :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br>විශේෂ උපාධිය :<br>i. පළමු පන්තියේ සාමර්ථ්‍යයක් සහිත උපාධියක්<br>ii. දෙවන පන්තියේ ඉහළ සාමර්ථ්‍යයක් සහිත උපාධියක්<br>iii. දෙවන පන්තියේ පහළ සාමර්ථ්‍යයක් සහිත උපාධියක්<br>සාමාන්‍ය උපාධිය :<br>i. පළමු පන්තියේ සාමර්ථ්‍යයක් සහිත උපාධියක්<br>ii. දෙවන පන්තියේ ඉහළ සාමර්ථ්‍යයක් සහිත උපාධියක්<br>iii. දෙවන පන්තියේ පහළ සාමර්ථ්‍යයක් සහිත උපාධියක් | <br><br><br>20<br>18<br>16<br><br>18<br>16<br>14 | 20 |
| 02. | වෘත්තීය සුදුසුකම් :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br>i. පශ්චාත් උපාධියක් සඳහා<br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු)<br>iii. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06/ පැය 720 කට නොඅඩු)<br>iv. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03/ පැය 360 කට නොඅඩු) | <br><br>15<br>13<br>10<br>08 | 15 |
| 03. | ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාව :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන,<br>i. ඉංග්‍රීසි විශේෂවේදී උපාධියක්<br>ii. ඉංග්‍රීසි භාෂාව උපාධියේ ප්‍රධාන විෂයයක් ලෙස (සාමාන්‍ය කලා උපාධිය යටතේ)<br>iii. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධියක්<br>iv. පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (කාල සීමාව 01 වසරකට වඩා වැඩි විය යුතුය.) | <br><br>15<br>08<br>07<br>07 | 15 |

| | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ නිර්ණායක | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | TOEFL, (TOEFL-iBT Score 79, TOFEL-CBT Score 213, TOEFL-PBT(Score 550 or above) හෝ IELTS (Score 6.0 or above) වැනි සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකමක් | | |
| | v. ඉංග්‍රීසි භාෂාව අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස (දේශීය හෝ ලන්ඩන් විෂය නිර්දේශවලට අනුව) | | |
| | විශිෂ්ට සාමර්ථ්‍යය | 05 | |
| | අධිසම්මාන සාමර්ථ්‍යය | 04 | |
| | සම්මාන සාමර්ථ්‍යය | 03 | |
| | සාමාන්‍ය සාමර්ථ්‍යය | 02 | |
| 04. | **විදේශ භාෂා ප්‍රවීණතාව** | | 10 |
| | අරාබි, චීන (මැන්ඩරින්), ප්‍රංශ, ජර්මන්, හින්දි, ඉතාලි, ජපන්, කොරියානු, රුසියානු හා ස්පාඤ්ඤ යන භාෂා | | |
| | i. විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය හදාරා තිබිය යුතුය.) | 10 | |
| | ii. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ - | | |
| | විශිෂ්ට සාමර්ථ්‍යය | 09 | |
| | අධිසම්මාන සාමර්ථ්‍යය | 08 | |
| | සම්මාන සාමර්ථ්‍යය | 07 | |
| | සාමාන්‍ය සාමර්ථ්‍යය | 06 | |
| | iii. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ - | | |
| | විශිෂ්ට සාමර්ථ්‍යය | 05 | |
| | අධි සම්මාන සාමර්ථ්‍යය | 04 | |
| | සම්මාන සාමාර්ථය | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 02 | |
| | iv. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06/ පැය 720 කට නොඅඩු) | 05 | |
| | v. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03/ පැය 360කට නොඅඩු) | 03 | |
| 05. | **පරිගණක ප්‍රවීණතාව** | | 05 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් | | |
| | i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් | 05 | |
| | ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක්(අවුරුද්දකට නොඅඩු) | 03 | |
| | iii. රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් ( මාස 06කට නොඅඩු/ පැය 720කට නොඅඩු) (තොරතුරු තාක්ෂණ උපාධිය මූලික සුදුසුකම වන්නේ නම්, මෙම ශීර්ෂය යටතේ තොරතුරු තාක්ෂණ උපාධියට ලකුණු ලබාදෙනු නොලැබේ.) | 02 | |
| 06. | **රාජ්‍ය භාෂා ප්‍රවීණතාව (විභාගයට පෙනී සිටින භාෂාව හැර)** | | 10 |
| | i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ පළමු භාෂාව ලෙස- | | |
| | විශිෂ්ට සාමර්ථ්‍යය | 06 | |
| | අධිසම්මාන සාමර්ථ්‍යය | 04 | |
| | සම්මාන සාමර්ථ්‍යය | 03 | |
| | සාමාන්‍ය සාමර්ථ්‍යය | 02 | |
| | ii. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවන භාෂාව ලෙස - | | |
| | විශිෂ්ට සාමර්ථ්‍යය | 04 | |
| | අධිසම්මාන සාමර්ථ්‍යය | 03 | |
| | සම්මාන සාමර්ථ්‍යය | 02 | |
| | සාමාන්‍ය සාමර්ථ්‍යය | 01 | |

| යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ නිර්ණායක | | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 07. | **පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා සහ විශේෂ කුසලතා** | | 25 |
| | පෞරුෂත්වය | 10 | |
| | සන්නිවේදන කුසලතා | 10 | |
| | විශේෂ කුසලතා | 05 | |
| | **එකතුව** | | 100 |

**සටහන :**
යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්‍රවල අදාළ කාලසීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාල සීමාව තහවුරු නොකළ සහතික පත්‍ර සඳහා ලකුණු ලබාදීම සඳහා සලකා බලනු නොලැබේ.

08. *අයදුම් කරන ආකාරය :*

I. අයදුම්පත්, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා පළමු පිටුවට ද ඉතිරිය දෙවන හා තෙවන පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතුය.

III. සම්පූර්ණ කරන ලද අයදුම්පත "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට 2021.05.10 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021)"යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ (සෙ. මී.2 x සෙ. මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ ඉංග්‍රීසි 'S' අක්ෂරය සඳහන් කළ යුතුය.

IV. සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

V. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේනම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

VI. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ තනතුර සඳහා සුදුසු යැයි පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. *විභාගයට ප්‍රවේශය :*

I. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු,නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ

පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

II. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ ඇයට නියම කරන ලද විභාග ශාලාවේදීය. සෑම අපේක්ෂකයකු/ අපේක්ෂිකාවකම විභාගයට පෙනී සිටින පළමු දිනයේදීම විභාගයට පෙනී සිටීමට පෙර, තම ප්‍රවේශ පත්‍රය, විභාග ශාලාධිපතිට භාර දිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ ගැසට් පත්‍රයේ පළ වේ.

10. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු.1,200/- ක් වන අතර අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනයට පෙර මෙම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු වේ.මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන බවද, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන බවද දන්වමි. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**සටහන :**

කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත්වන හෝ නොපැමිණ සිටින හෝ විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හෝ වෙනත් විභාගයකට මාරු කිරීමට හිමිකමක් නැත.

11. **අයදුම්කරුගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. *ප්‍රතිඵල නිකුත් කිරීම* :

මෙම නිවේදනයේ 06 ඡේදයට අනුව උපරිම සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණයට යොමු කිරීමෙන් අනතුරුව එම පරීක්ෂණ දෙකෙන්ම ලබාගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබාදෙනු ඇත. අනතුරුව විභාගයට පෙනීසිටි සියලුම අයදුම්කරුවන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදුකරනු ඇත.

13. **සාවද්‍ය තොරතුරු සැපයීම**

අපේක්ෂකයා විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීතිරීතිවලට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

16. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
ලේකම්,
විදේශ අමාත්‍යාංශය.

2021 අප්‍රේල් මස 09 වැනි දින,
විදේශ අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

විදේශ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2020 (2021)**

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO
GRADE III OF THE SRI LANKA FOREIGN SERVICE - 2020 (2021)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

☐ (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 ☐

01 (i) (අ) මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි) කැපිටල් අකුරෙන් උදා : (SUMANASIRI, E.D.C.B.A) :
(ආ) මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :

(i) පදිංචි ස්ථානය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(විභාග ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මෙම ලිපිනයටය)
(ii) කාර්යාලයීය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. ගැසට් නිවේදනයේ අංක 6. X. (ඉ) පරිදි 'භාෂා ප්‍රවීණතාව' විෂයය සඳහා ඉල්ලුම් කරන භාෂාව : ☐
(සිංහල -2, දෙමළ -3, ඉංග්‍රීසි- 4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. දුරකථන අංකය :
(i) ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

(ii) කාර්යාලයීය ☐☐☐☐☐☐☐☐☐☐

07. (i) උපන් දිනය :

අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

08. ජනවර්ගය :

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ -3, මුස්ලිම් - 4, වෙනත්-5)

09. සිවිල් තත්වය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
අවිවාහක - 1
විවාහක - 2

10. ශ්‍රී ලංකා විදේශ සේවයට පත්වීම සඳහා මීට පෙර යම් විභාගයකට පෙනී සිට ඇත්නම් අවුරුද්ද/අවුරුදු සඳහන් කරන්න.
(අ) ..........................................
(ආ) ..........................................
(ඇ) ..........................................

11. ඔබ රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන උපාධිධාරියෙක් නම් එම තනතුරේ නම සඳහන් කරන්න :

12. උපාධිය පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය : (මෙහිලා සුදුසුකම් තිබේදැයි දැනගනු පිණිස මේ දැන්වීමේ 2(i) ඡේදය කියවා බලන්න.)
(i) විශ්වවිද්‍යාලය / ආයතනය :
(ii) උපාධියේ නම :
(iii) උපාධිය පිරිනැමූ දිනය :
(iv) සාමාන්‍ය / විශේෂ :
(v) විෂයයන් :
(vi) පන්තිය :

13. අදාළ වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා / විදේශ භාෂා ප්‍රවීනතාව ආදිය) සඳහන් කරන්න. :
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

14. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| ලදුපත මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) |

15. අයදුම්කරුගේ සහතිකය :
මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකිබව මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* ඃ

(දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයකු/අපේක්ෂිකාවක නම් පමණි.)

........................ මහතා/මෙනෙවිය/මිය ............ දිනට පූර්වාසන්න පස් අවුරුදු/ ............ අවුරුදු කාලසීමාව තුළ (අ) තමාට හිමි සියලු වැටුප් වර්ධක උපයා ඇති බවත්, (ආ) අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත් සොයා බලා සැකහැර දැන ගතිමි.

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

මෙම නිලධාරියා/ නිලධාරිණිය තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකිවේ.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවිය.

දිනය :————.

04-494

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

02. *සේවා කොන්දේසි* ඃ

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන් හි සඳහන් පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ මට්ටම අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. වැටුප : අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාල මාසික වැටුප් පරිමාණය (MN 2-2016) රු.28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු.47,990 (ආරම්භක වැටුප - රු.28,940) ක් වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම්* :

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(*ඈ*) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී ගණිතය ඇතුළු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. (අධිකරණ යතුරු ලේඛක (සිංහල) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල භාෂාව සඳහා ද, අධිකරණ යතුරු ලේඛක (දෙමළ) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාව සඳහා ද, අධිකරණ යතුරු ලේඛක (ඉංග්‍රීසි) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව සඳහා ද සම්මාන සාමාර්ථයත් තිබිය යුතුය.)

*සහ*

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක යතුරු ලියනය පාඨමාලාවක් හෝ යතුරු ලියනය ද විෂයක් වශයෙන් ඇතුළත්ව ඇති පරිගණක පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම.

*සැ.යු.* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021 මැයි 10 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *විභාග පටිපාටිය* :

විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|
| 01 භාෂා හැකියාව | 100 | 40 |
| 02 අභියෝග්‍යතාවය | 100 | 40 |
| 03 යතුරු ලියනය | 100 | * |

(*පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

යතුරු ලියනය සඳහා තමන් අයදුම් කරන ශ්‍රේණියට අදාල ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය. රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත) .

විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 03 | යතුරු ලියනය (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) | යතුරු ලියනය (සිංහල) දෙනු ලබන වචන 400 ක ඡේදයක් විනාඩියකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | යතුරු ලියනය (දෙමළ) දෙනු ලබන වචන 400 ක ඡේදයක් විනාඩියකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | යතුරු ලියනය (ඉංග්‍රීසි) දෙනු ලබන වචන 600 ක ඡේදයක් විනාඩියකට වචන 30 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |

*සටහන.-* සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

*විභාග ප්‍රතිඵල.*-අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් තැපැලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු.*-විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය -*

(*අ*) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

(*ඇ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2021 මැයි මස 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ/ඉංග්‍රීසි)** III **ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2021 මැයි මස 10 ට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(*ඈ*) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(*ඉ*) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(*ඊ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. *විභාගයට පෙනී සිටීම.*- ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරණ ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*-තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

13. *විභාගයට ඇතුළත් වීම* :

(*අ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.*- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2021 අප්‍රේල් මස 05 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල /දෙමළ /ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:
සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. පෞද්ගලික තොරතුරු :
2.1 මුලකුරු සමග නම :————. මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) *උදා :* A.P.K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

2.5 පදිංචි දිස්ත්‍රික්කය :————.

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

2.7 ජාතික හැඳුනුම්පත් අංකය

2.8 උපන් දිනය :————.
වර්ෂය : මාසය : දිනය :

2.9 2021 මැයි 10 දිනට වයස :
අවුරුදු : මාස : දින :

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————. ෆැක්ස් :————.

03. අධ්‍යාපන සුදුසුකම් :
3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(1) විභාගයේ වර්ෂය හා මාසය :————.
(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තරඃ

(1) විභාගයේ වර්ෂය හා මාසය :————.

(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. යතුරු ලියනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : ..........................................
(පාඨමාලාව සමත් සහතිකය අමුණන්න)

05. වෙනත් සුදුසුකම් : ............................................................................................
.................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | නැත |
|---|---|
| ☐ | ☐ |

......................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරඃ
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
ලදුපත් අංකය හා දිනය :————.
ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

08. අයදුම්කරුගේ සහතිකය :

(*අ*) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඈ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .......................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී...................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2021 මැයි 10 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

දිනය :————. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :————.
නිල මුද්‍රාව :————.

04-593/1

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ
අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

02. *සේවා කොන්දේසි* :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට අදාළ මට්ටම අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. *වැටුප.-* අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 2-2016) රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47,990 (ආරම්භක වැටුප - රු. 28,940) ක් වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම්* :

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(*ඈ*) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(*ඉ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී ගණිතය ඇතුලු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම (අධිකරණ ලඝු ලේඛක (සිංහල) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල භාෂාව සඳහා ද, අධිකරණ ලඝු ලේඛක (දෙමළ) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාව සඳහා ද සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.)

සහ

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛනය සහ යතුරු ලියනය පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම.

*සැ.යු.-* සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021 මැයි මස 10 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය්‍ය වේ.

06. *විභාග පටිපාටිය* : විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03)යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|
| 01 භාෂා හැකියාව | 100 | 40 |
| 02 අභියෝග්‍යතාවය | 100 | 40 |
| 03 ලඝු ලේඛනය හා යතුරු ලියනය | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ලඝු ලේඛනය හා යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

ලඝු ලේඛනය හා යතුරු ලියනය සඳහා තමන් අයදුම් කරන ගණයට අදාළ ප්‍රශ්න පත්‍රය තෝරාගත යුතුය. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

*විභාගය සඳහා වන විෂයය නිර්දේශය* :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 03 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/දෙමළ) | ලඝු ලේඛනය (සිංහල)<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් පිටපත් කිරීම<br>යතුරු ලියනය (සිංහල)<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | ලඝු ලේඛනය (දෙමළ)<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් පිටපත් කිරීම<br>යතුරු ලියනය (දෙමළ)<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |

*සටහන* : සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් තැපැලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම්

සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු* : විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල **"අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039** ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

(*ඇ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2021 මැයි මස 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2021 මැයි මස 10 දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(*ඈ*) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(*ඉ*) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(*ඊ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. *විභාගයට පෙනී සිටීම* .- ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තව ද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* .- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(*ඇ*) වලංගු රියැදුරු බලපත්‍රය.

13. *විභාගයට ඇතුළත් වීම* :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

**සටහන.-** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව

2021 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල /දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යඃ
සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමග නම :————. මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : A.P.K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

2.5 පදිංචි දිස්ත්‍රික්කය :————.

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

2.7 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

2.8 උපන් දිනය :————.

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

2.9 2021 මැයි 10 දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————. ෆැක්ස් :————.

03. අධ්‍යාපන සුදුසුකම් :
3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(1) විභාගයේ වර්ෂය හා මාසය :————.
(2) විභාග අංකය :————.
(3) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තරඃ
(1) විභාගයේ වර්ෂය හා මාසය :————.
(2) විභාග අංකය :————.
(3) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. ලඝුලේඛනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : ........................................
(පාඨමාලාව සමත් සහතිකය අමුණන්න)

05. වෙනත් සුදුසුකම් : ..............................................................................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐ .....................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරඃ
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
ලදුපත් අංකය හා දිනය :————.
ගෙවූ මුදල :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |

08. *අයදුම්කරුගේ සහතිකය* :
(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.
(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නිතීරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .......................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී....................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝුලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2021 මැයි 10 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද ඔහුගේ /ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :————. ————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව :————.

04-593/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.